රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 374

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය, කොළඹ 7.
1987 ජූනි මස 12 වැනි දින.

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් හා
දෙපාර්තමේන්තු ප්‍රධානයන් වෙතය.

**රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය යටතේ වන ඒකාබද්ධ සේවාවන්ට
අයත් ලිපිකරුවන්, ලඝුලේඛකයන්, යතුරු ලේඛකයන් හා
පොත් බැඳුම්කරුවෝ.**

අධිකරණ නිලධරයන් ද උපලේඛනගත රජයේ නිලධරයන් ද පත්කිරීම, මාරු කිරීම, සේවයෙන් පහකිරීම සහ ඔවුන්ගේ විනය පාලනය, ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 114 වැනි ව්‍යවස්ථාවෙන් අධිකරණ සේවා කොමිෂන් සභාව වෙත පවරා ඇත.

02. උපලේඛනගත රජයේ නිලධරයා යන්නට ශ්‍රේෂ්ඨාධිකරණයේ හෝ අභියාචනාධිකරණයේ හෝ යම් මුල් අවස්ථා අධිකරණයක හෝ රෙජිස්ට්‍රාර් කාර්යාලයේ සේවයේ නියුක්ත කර ඇත්තා වූ හා පස්වැනි උපලේඛනයෙහි නිශ්චිත ව දැක්වෙන ගණයකට අයත් වන්නා වූ යම් රජයේ නිලධරයෙක් අයත් වේ.

03. පස්වන උපලේඛනයෙහි, වෙනත් අය අතර, ලිපිකරුවන් ද, ලඝුලේඛකයන් ද, යතුරු ලේඛකයන් ද, පොත් බැඳුම්කරුවන් ද, සඳහන් කර ඇත.

04. ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව ක්‍රියාත්මකවීමෙන් පසුව ඒ ඒ සේවාවන්හිම රැඳී සිටීමට විකල්පය පළ කළ සාමාන්‍ය ලිපිකරු සේවයේ ලිපිකරුවන්, රජයේ ලඝුලේඛක සේවයේ ලඝු ලේඛකයන්, රජයේ යතුරු ලේඛක සේවයේ යතුරු ලේඛකයන් හා කාර්යාල සේවක සේවයේ පොත් බැඳුම්කරුවන් පිළිබඳ පත් කිරීම්, මාරු කිරීම්, සේවයෙන් පහ කිරීම් හා විනය පාලනය, මාණ්ඩලික ශ්‍රේණියට අයත් නොවූවන් සම්බන්ධයෙන් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ වෙත ද, මාණ්ඩලික ශ්‍රේණියට අයත් වූවන් සම්බන්ධයෙන් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම් වෙත ද පවරා ඇත.

Siriwardhana
(ඩී. බී. අයි. පී. එස්. සිරිවර්ධන)
ලේකම්
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය.

–/ත.